විශිෂ්ටයන්ගේ
අතිවිශිෂ්ටයන්
බිහිකරන පාඩම් මාලාව
8

බුද්ධි කලම්බනයක නවමු මඟ

ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත තරග විභාගය

මෙම පාඩම් මාලාව පහත සඳහන් විෂයයන් හතරම ආවරණය කරනු ලබයි. සාමාන්‍ය බුද්ධිය, සාමාන්‍ය දැනීම, රචනය හා සාරාංශය, කළමනාකරණ අභියෝගතාවය, මෙම විෂයයන් ප්‍රශ්න පත්‍ර හතරක් ලෙසින් පහත පරිදි විභාගයට ලැබේ.

සාමාන්‍ය බුද්ධිය කාලය පැය 1 යි - බහුවරණ ප්‍රශ්න 50 යි ලකුණු 100යි

සාමාන්‍ය දැනීම කාලය පැය 2යි බහුවරණ 50 යි, ව්‍යුහගත 25 යි ලකුණු 100යි

රචනය හා සාරාංශය කාලය පැය 2 යි රචනය වචන 200කි,සාරාංශයක් ලැබූ ලකුණු 100යි.

කළමනාකරණ අභියෝගතාවය කාලය පැය 2 යි බහුවරණ 50යි ව්‍යුහගත 25 යි ලකුණු 100 යි.

සාමාන්‍ය දැනීම - 2

01. දකුණු ආසියානු වරණීය වෙළඳ වැඩ පිළිවෙළ (South Asian Preferential Trading Arrangement – S. A. P. T. A - සප්තා)

I. අයත් රටවල් :- දකුණු ආසියානු කලාපයේ රාජ්‍යයන් වන බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය, ශ්‍රී ලංකාව හා ඇෆ්ගනිස්ථානය.

II. ආරම්භ කළ දිනය :- 1995 දෙසැම්බර් 07

III. අරමුණු :-

- තීරු බදු හා තීරු බදු නොවන බාධක ඉවත් කරමින් සාර්ක් කලාපය තුළ ආර්ථික සහයෝගීතාව හා වෙළඳාම වර්ධනය කිරීම.
- රටවල් එකිනෙකට පිරිනමන වෙළඳ සහන තුළින් සෑම රටකටම සමාන ලෙස ආර්ථික වාසි බෙදීයාම.
- සාමාජික රටවල් අතර වෙළඳාම නිර්බාධකරණය
- ඉතා අඩු දියුණු සාමාජික රටවල්වලට විශේෂ සහන පිරිනැමීම.
- සාර්ක් කලාපයේ රටවල්වල ආර්ථික වර්ධනය ඇති කිරීමෙහිලා පෞද්ගලික අංශ අතර සමීප සහයෝගීතාවක් වර්ධනය කර ගැනීම.
- ක්‍රි. ව. 2000 දී හෝ 2005 දී නියත ලෙසම කලාපයේ රටවල් අතර වෙළඳ ප්‍රදේශයක් ඇති කිරීම.

02. තීරුබදු හා වෙළඳාම පිළිබඳ පොදු සම්මුතිය - (General Agrement of Tariff and Traed GATT - ගැට්)

I. අයත් රටවල් :- ඕස්ට්‍රේලියාව, බෙල්ජියම, බ්‍රසීලය, බර්මා, කැනඩාව, ශ්‍රී ලංකාව, චිලී, චීනය, කියුබාව, චෙකොස්ලෝවැකියාව, ප්‍රංශය, ඉන්දියාව, ලෙබනනය, ලක්සම්බර්ග්, නෙදර්ලන්තය, නවසීලන්තය, නෝර්වේ, පකිස්ථානය, දකුණු රොඩේෂියාව, සිරියාව, දකුණු අප්‍රිකාව, බ්‍රිතාන්‍ය හා ඇමරිකාව.

II. ආරම්භක දිනය :- 1948 ජනවාරි 01

III. අරමුණු :-

- තීරු බදු සහ තීරු බදු නොවන බාධක අඩු කර ගැනීම මඟින් ජාත්‍යන්තර වෙළඳ කටයුතු ලිහිල් කිරීම.
- සියලුම වෙළඳ හවුල්කරුවන්ට එක හා සමානව සැලකීම.

මෙමගින් ජාත්‍යන්තර වෙළඳ සබඳතා පවත්වා ගෙන යාම සඳහා සුදුසු පරිසරයක් ගොඩ නැංවීම අපේක්ෂා කරයි.

- සාමාජික රටවල් වෙළඳ කටයුතු සම්බන්ධයෙන් ඒකපාර්ශවීය තීරණ ගැනීම වැළැක්වීම පිණිස සාමාජික රටවල් සඳහා නීති මාලාවක් සම්පාදනය කිරීම.

03. බහු කෙදි ගිවිසුම

I. ආරම්භක වර්ෂය :- 1950

II. අරමුණු :-

- රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අපනයනය සඳහා ස්ථාවර වෙළඳ පොළක් සහතික කරදීම.
- මිල ආරක්ෂා කර ගැනීම සහ ඉහත දක්වූ ස්ථාවර වෙළඳ පොළක් සහතික කර ගැනීමට සාමාජික රටවල් අපනයන කොටස් වෙන් කර ගැනීම.
- උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව ඇඟළුම් අපනයනයේදී මෙරටට හිමි සලාකය (පංගුව) වෙන් කර ගැනීම සඳහා ඇමරිකාව සහ යුරෝපීය රටවල් සමඟ ගිවිසුමක් ඇති කර ගෙන සිටියි.

04. බැංකොක් ගිවිසුම

I. අයත් රටවල් :- බංග්ලාදේශය, ඉන්දියාව, ලාඕසය, කොරියා ජනරජය, ශ්‍රී ලංකාව, චීන මහජන සමූහ ආණ්ඩුව.

II. ආරම්භ කරන ලද වර්ෂය :-

III. අරමුණු :-

- ආසියා, ශාන්තිකර ආර්ථික හා සාමාජික කොමිසමට අයත් ඌන සංවර්ධිත රටවල් අතර ලිහිල් වෙළඳ ප්‍රතිපත්ති ඇති කිරීමෙන් ඔවුනොවුන් අතර වෙළඳාම ව්‍යාප්ත කිරීම.
- තීරුබදු සහන තවදුරටත් වැඩි කිරීම.
- පෞද්ගලික අංශයේ වෙළෙඳ හා ආයෝජන කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- මෙය වරණාත්මක වෙළඳ ගිවිසුමකි.

05. ආසියාන් සංවිධානයේ නිදහස් වෙළඳ ප්‍රදේශය ASEAN FREE TRADE AREA (AFTA)

I. අයත් රටවල් :- ඉන්දුනීසියාව, බෲනායි, මැලේසියාව, පිලිපීනය, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය, ලාඕසය, බුරුමය හා කාම්බෝජය.

II. ආරම්භක වර්ෂය :- 1992 ජනවාරි 28

III. අරමුණු :-

- අග්නිදිග ආසියානු කලාපයේ තීරු බදු හා තීරු බදු නොවන බාධක ඉවත් කරමින් වෙළඳාම වර්ධනය කිරීම.
- අග්නිදිග ආසියානු කලාපය තුළ සෘජු විදේශ ආයෝජනවලට ආකර්ශනයක් ඇති කිරීම.

06. ඇන්ඩීන් ගිවිසුම - Andean Pact

I. අයත් රටවල් :- බොලීවියාව, ඉක්වදෝරය, පේරු, වෙනිසියුලාව, කොලොම්බියාව.

II. ආරම්භක වර්ෂය :- 1969 මැයි 25

III. අරමුණු :-

- ආර්ථික සහයෝගීතාවය සැලසුම් කිරීම.
- වෙළඳාම හා තීරු බදු පිළිබඳව සාමූහික ප්‍රතිපත්ති අනුගමනය කිරීම.
- තීරු බදු පිළිබඳ පොදු ක්‍රමයක් අනුගමනය කිරීම.

07. මධ්‍යම ඇමෙරිකානු පොදු වෙළඳ පොළ

I. අයත් රටවල් :- මධ්‍යම ඇමරිකානු රටවල්

II. ආරම්භක වර්ෂය :- 1960 දෙසැම්බර් 13

III. අරමුණු :-

- 1958 හඳුන්වා දෙන ලද බහු පාර්ශ්වීය නිදහස් වෙළඳ හා ආර්ථික ගිවිසුම වෙනුවට හඳුන්වා දුනි.
- එම කලාපයේ රටවල තීරුබදු හා විවිධ වෙළඳ බාධක ඉවත් කර ගැනීම හා අවම කිරීම.

08. ඇමසෝන් ගිවිසුම - Amazon Pact

I. අයත් රටවල් :- බොලීවියාව, බ්‍රසීලය, කොලොම්බියාව, ඉක්වදෝරය, ගයනාව, පේරු, සුරිනාම්, වෙනිසියුලාව.

II. ආරම්භක දිනය :- 1978 ජූලි 03

III. අරමුණු :-

* කලාපයේ ආර්ථික සහයෝගීතාව හා අදහස් හුවමාරුව.

ආශ්‍රිත ග්‍රන්ථ

01. http://en . wikipedia. org / wiki / ASEAN -Free-Trade-Area

02. http://en.wikipedia.org /wiki/General V Agreement-on-Tariffs-and-Trade

03. ලියනගේ, තන්දසේන. 2008, ජාත්‍යන්තර වෙළඳාම හා මූල්‍ය. එස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10.

04. සෙනෙවිරත්න, චාමින්ද. 2002, ලෝක සංවිධානIII ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11.

ලෝක වෙළඳ සංවිධානය මඟින් පාලනය කරන ගිවිසුම්

1. වෙළඳාම හා බදු පිළිබඳ පොදු සම්මුතිය.
2. සේවා වෙළඳාම පිළිබඳ ප්‍රථම ගිවිසුම.
3. වෙළඳාමට අදාළ බුද්ධිමය දේපල හිමිකම (TRIPS)
4. වෙළඳාම හා බැඳුනු ආයෝජන පියවර (TRIMS)
5. සනීපාරක්ෂාව හා ශාක සෞඛ්‍ය ප්‍රමිතීන් යොදා ගැනීම පිළිබඳ ගිවිසුම (SPS)
6. මූල්‍ය සේවා ගිවිසුම (FSA)
7. කෘෂිකර්මය පිළිබඳ ගිවිසුම (AOA)
8. සහනාධාර හා වන්දි දීමේ පියවර පිළිබඳ ගිවිසුම (ASCM)
9. වෙළඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ගිවිසුම (TBT)
10. රජයේ මිලදී ගැනීම් පිළිබඳ ගිවිසුම. (AGP)

තොරතුරු :- 2008 ජූලි මස 20 වැනි ඉරිද දිවයින පත්‍රය සියපත සඟරාව.

බුද්ධිමය දේපළ හිමිකම්වල වෙළඳාමට අදාළ කරුණු පිළිබඳ වූ ගිවිසුම (TRIPS)

බුද්ධිමය දේපළ හිමිකම්වල වෙළඳාමට අදාළ කරුණු පිළිබඳ ගිවිසුම (TRIPS) 1993 වර්ෂයේ පැවති උරුගුවේ සාකච්ඡා වටයේදී ඉදිරිපත් කරනු ලැබිය.

එහෙත් මෙම ගිවිසුම බලගන්වන ලද්දේ 1995 ජනවාරි 1 දිනය.

බුද්ධිමය දේපළ හිමිකම්වල වෙළඳාමට අදාළ කරුණු පිළිබඳ වූ ගිවිසුමෙහි TRIPS ප්‍රධාන පරමාර්ථ :-

1. සංවර්ධනය වෙමින් පවතින රටවල බුද්ධිමය දේපල ආරක්ෂණය හා එය බල ගැන්වීම.
2. කොල්ලකාගත් හා ව්‍යාජ නිශ්පාදන නැගෙනහිර ආසියානු හා ලතින් ඇමරිකානු රටවල්වලින් අපනයනය කිරීම වැළැක්වීම.

TRIPS සම්බන්ධ වැදගත් කාරණය වන්නේ එමගින් බුද්ධිමය දේපළ හිමිකම් ලෝක වෙළඳ සංවිධානය යටතේ වෙළඳාමට සම්බන්ධ කිරීමත් බර්න් හා පැරිස් ගිවිසුම්වල සඳහන් කරුණු ඒ යටතට ගැනීමත්ය. අදවන විට අදාළ කරුණු පිළිබඳ වූ ගිවිසුමට යටත් නොවී ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකත්වය ලැබීමටත් එමගින් ලෝක වෙළඳ පද්ධතියේ කොටස්කරුවකු වීමටත් නොහැකි වී ඇත.

කෘෂිකර්මය පිළිබඳ ගිවිසුම (AOA)

අන්තර්ජාතික ආහාර වෙළඳාම මත නීති පැනවෙන අතර එතුළින් ආහාර මහා පරිමාණයෙන් වෙනත් රටවල වෙළඳ පොළවල ගොඩගැසීමට එරෙහි ආරක්ෂණ ක්‍රම තම රටේ වෙළඳ පොළ සඳහා ආහාර නිෂ්පාදනය කරන ගොවීන්ගේ ආරක්ෂාව සැලසීම, ගොවීන් හා තිරසාර කෘෂිකාර්මික ප්‍රතිපත්තීන් වෙනුවෙන් දෙන රාජ්‍ය අනුග්‍රහය, හදිස්සි අවශ්‍යතාවයන් සඳහා ආහාර තොග පවත්වා ගෙන යාම හා රටවැසියන්ට අවශ්‍ය තරම් ආහාර ඇති බවට වගබලා ගැනීම ද ඇතුළත් දේශීය කෘෂිකාර්මික ප්‍රතිපත්තීන්ට සීමා පැනවේ.

මූල්‍ය සේවා ගිවිසුම (FSA)

මෙය ස්ථාපිත කරන ලද්දේ බැංකු හා රක්ෂණ සමාගම් ඇතුළු මූල්‍ය සේවා සංස්ථාවන්ට ව්‍යාප්ත වීමට ඇති බාධක ඉවත් කිරීමටය. මෙමගින් මූල්‍ය අංශයේ දැවැන්ත ඒකාබද්ධ වීම්වලට දොර හැරෙන අතර රටවල් තුළ ආර්ථික පාලනය කළ නොහැකි තත්ත්වයක් ඇතිවේ.

වෙළඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ගිවිසුම (TBT)

පාරිසරික ලේබල් රෙගුලාසි වැනි වෙළඳාමට බලපෑම් ඇතිකරන ජාතික රෙගුලාසි (බද්දමය නොවන බාධක) සීමා කිරීමට ඇති කර ගත්තකි.

The WTO Game

තොරතුරු :- 'ලෝක වෙළඳ සංවිධාන ක්‍රීඩාව' ශ්‍රී ලංකා සේවා ලංකා පදනම / එන්. පී. කරුණාදස (පරිවර්තනය)

ආසියා පැසිෆික් ආර්ථික සහයෝගීතාවය APEC

ආසියා පැසිපික් කලාපයේ ආර්ථික වර්ධනය, සාමූහිකත්වය, වෙළඳාම සහ ආයෝජනයට පහසුකම් සැලසීම වෙනුවෙන් APEC සහයෝගීතාවය පිහිටුවාගෙන ඇත.

APEC යනු ලොව අන්තර් රාජ්‍ය කණ්ඩායම් මත ඇතිවූ නොබැඳුණු තත්වයන්, විවෘත සාකච්ඡා හා සියලූ සාමාජිකයන්ගේ දර්ශනයන්ට එක සමානව ගරු කරන ගිවිසුමකි.

ලෝක වෙළඳ සංවිධානය (WTO) වැනි වෙනත් බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම්වලින් වෙනස්වන මෙහි පාර්ශවකරුවන් විසින් ගිවිසුම ගැන කිසිදු විරෝධතාවක් එල්ලකර නැත. ස්වේච්ඡා පදනම මත තීරණ ගනු ලබයි.

සාමාජිකයන් :- 21

ඕස්ට්‍රේලියා, බෲණායි, කැනඩාව, චිලී, මහජන චීන සමූහාණ්ඩුව, හොංකොං, ඉන්දුනීසියා, ජපානය, කොරියාව, මැලේසියාව, මෙක්සිකෝව, නවසීලන්තය, පැපුවා නිව්ගිනියාව, පීරු, පිලිපීනය, රුසියාව, සිංගප්පූරුව, චීන තායිපේ, තායිලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, වියට්නාමය.

ලෝක ජනගහනයෙන් 40%ක සාමාජිකත්වය දරයි.

ලෝක වෙළඳාමෙන් 43.7%ක සාමාජිකත්වය ඇත.

ලෝක දළ ජාතික නිෂ්පාදිතයෙන් 54.2% සාමාජිකත්වය වේ.

ආරම්භය :- 1989

අරමුණු :-

කලාපයක් ලෙස සහයෝගීව ආර්ථික වර්ධනය ඇතිකිරීමේ අරමුණින් ස්ථාපිත විය. කලාපය අතර වන වෙළඳ ගනුදෙනුවලදී බදු හා වෙළඳ බාධා අඩු කර ගෙන වර්ධනය වන අපනයන ඇති කරගනිමින් දේශීය වශයෙන් ඵලදායී ආර්ථිකයක් ලබාගැනීම අපේක්ෂිත විය.

නව දැක්ම

* 2010 දී සඳහන් හා විවෘත වෙළඳාමක් හා ආයෝජනයක් ආසියා පැසිපික් කලාපය තුළ ඇති කිරීම.

* 2020 දී වර්ධනය වන ආර්ථිකයක් ඇති කිරීම.

1994 ඉන්දිනීසියානු බෙහාර් සමුළුවේදී 1994 නායකත්ව ප්‍රකාශනයේ Bogor Goals ලෙස මෙම අරමුණු එළිදැක්වේ.

ප්‍රයෝජන :- නිදහස් හා විවෘත වෙළඳාමෙන් අඩු මිල සහිත භාණ්ඩ නිපදවීම් බිහිවීම නිසා භාණ්ඩ හා සේවාවල මිල අඩුවීම, එය ආර්ථික වර්ධනයට දායක කරගත හැකි වීම, රැකියාවෙන් සහ ජාත්‍යන්තර වෙළඳාම, ආයෝජන පුළුල් වීම, කර්මාන්ත සුරැකීම හා නිෂ්පාදන වියදම අඩුවීම, කලාපය තුළ ආර්ථික හා තාක්ෂණ සහයෝගීතාව ඇතිවීම.

Canada – unitad states free Trade Agreemetnt

ආරම්භය :- 1988

ඇමරිකාව හා කැනඩාව අතර 1988 දී ගිවිසුම ඇතිවිය. ඇමරිකාව විසින් 1988 දී මෙක්සිකානු රජය හා සාකච්ඡා පැවැත්වූ අතර 1988 දී කැනඩාව විසින් ඊට එක්වීමට මෙක්සිකෝවට ආරාධනා කළේය. 1992 දී මේ රටවල් mastricht ගිවිසුමට අත්සන් කරන ලදී.

සාමාජිකත්වය :- කැනඩාව, ඇ. එ. ජ, මෙක්සිකෝව,

1994 ජනවාරි 1 සිට රටවල් අතර නිදහස් වෙළඳ ගනුදෙනු වෙනුවෙන් හා වෙළඳ බදු, බාධා අවම කිරීමට ක්‍රියාත්මකයි.

අප්‍රිකා කැරිබියන් ගිවිසු ගිවිසුම

යුරෝපා සංගමය හා අප්‍රිකා, කැරිබියන්, පැසිෆික් රාජ්‍යයන් අතර සංවිධානය සඳහා ආධාර වෙළඳ කටයුතු, දේශපාලන සහයෝගීත්වය සඳහා ආරම්භ විය.

මෙම සබඳතාව 1957 රෝම ප්‍රඥප්තියෙන් පසුව ඇතිවිය. ACP හෙවත් අප්‍රිකා, කැරිබියන් හා පැසිපික් හි යැපෙන රටවල් සිය ආර්ථික හා සමාජ සංවර්ධනය වෙනුවෙන් හා වැඩුණු ආර්ථිකයක් වෙනුවෙන් එක් පිරිසක් ලෙස ඒකරාශී වී ඇත.

ලෆ්ටා LAFTA

ආරම්භය :- 1960 මොන්ටෙවිඩියෝ ප්‍රඥප්තියෙන් ඇරඹුණි.

ආරම්භක සාමාජිකත්වය :- රාජ්‍ය 7කි. ආජන්ටිනා, බ්‍රසීලය, චිලී, පැරගුවේ, පේරු, උරුගුවේ.

අරමුණු :- ලතින් ඇමරිකාව තුළ පොදු වෙළඳපොළක් නිර්මාණය කිරීමත් කලාපීය වෙළඳ බදුවලින් ඉවත් කිරීමත් අරමුණු විය.

1962 සිට ක්‍රියාත්මක විය.

යුරෝපා සංගමය හා ඇමරිකාව මෙන් පොදු වෙළඳ කලාපයක් ඇතිකර ගැනීම අපේක්ෂා කළ අතර ඊට ආයතන කිහිපයක් නිර්මාණය කළේය.

* විදේශ අමාත්‍යවරුන්ගේ සංගමය

* සහභාගී රාජ්‍යයන්ගේ සමුළුව

* ස්ථිර කවුන්සිලය

සීමා

* භාණ්ඩවලට සීමා වූ අතර සේවා සලකා නොබැලූණි.

* ප්‍රතිපත්තිමය මෙහෙයවීමක් නොවීය.

* (E U හි දේශපාලන ආර්ථික සහයෝගීතාවය සමඟ සසඳන කළ ඉතා දුර්වල සබඳතා විය.)

1970 දී :- බොලීවියා, කොලොම්බියා, ඉක්වදෝර්, වෙනිසියුලා, එක්විය.

1980 දී :- ලතින් ඇමරිකානු සහයෝගීතා සංවිධානය ලෙස හැඳින්වීමට පටන් ගැනුනි.

වාසි

ලතින් ඇමරිකානු කලාපයට ධනවාදී වෙනස්කම් ගෙනාවේය.

* නිෂ්පාදන හැකියාව වර්ධනය විය. ඉන් කලාපීය අවශ්‍යතා සැපිරුණි.

* අවම නිෂ්පාදක වියදමක් දරා ඉහළ භාණ්ඩ ප්‍රමාණයක් නිපදවූ අතර එම භාණ්ඩවලට කලාපය විශේෂවීමෙන් නව ආයෝජන ආකර්ශනීය විය.

දුර්වලතා

* තනි රාජ්‍යයක් ලෙස ආර්ථික, සමාජ ගැටලූ ඇතිවිය.

* දියුණු, දියුණුවෙමින් පවතින හා නොදියුණු ලෙස සිදුකළ කලාපය තුළම වූ වර්ගීකරණය හේතුවෙන් අසමාන ආර්ථික සහිත රාජ්‍යයන්ගේ දිනීම ප්‍රශ්න ඇතිකරන්නක් විය. බොහෝ අසංවර්ධිත රාජ්‍යයන් පැවතීම දියුණුවට බාධා ගෙනාවේය.

LAIA

සාමාජිකත්වය :- LAFTA හි සාමාජික රටවල්වලින් 12කි.

ආරම්භය :- 1980 අගෝස්තු 12

මොන්ශවීම්යෝ සම්මුතිය පදනම් කරගෙන බිහිවිය. මෙය වෙළඳ සහයෝගීතා ගිවිසුමකි.

වසර 12ක් තුළ LAFTA විසින් සපුරාගත නොහැකි වූ අරමුණු යථාර්ථයක් කරගැනීම වෙනුවෙන් LAIA බිහිවූ අතර LAFTA හි ප්‍රගතියට වඩා වැඩි ප්‍රගතියක් ලද LAIA, LAFTA හි දුර්වලතා ඉවත් කළ සංවිධානයකි.

කලාපයේ පොදු වෙළඳපොළක් ඇතිකර ඒ හරහා ආර්ථික, සමාජ සංවර්ධනයක් ඇතිකරගැනීම මූලික පරමාර්ථය විය.

මීළඟ පාඩම සිකුරාදා (24) පත්‍රයේ

ඉදිරිපත් කිරීම
අනුෂා ගෝකුළ ප්‍රනාන්දු
අධ්‍යක්ෂ බස්නාහිර පළාත්
සමාජ සේවා දෙපාර්තමේන්තුව

දිනමිණ පුවත්පත ඔබට ලබා ගැනීමේ අපහසුතා ඇත්නම් පුවත්පත් බෙදා හැරීමේ කළමනාකරු, 011 2429371, දුරකථන අංකයට හෝ 011 2429378 සහ 011 2429776 යන දුරකථන අංකයන්ට අමතා හෝ 011 2429470 යන Fax අංකයට දන්වා විස්තර ලබා ගන්න.

■■■■■■■■ ■■■■■■■■ ■■■■■■■ ■■■■■■■■■■■ ■■■■■■ ■■■■■ © 2010 ■■■■■■■ ■■■■■■■■ ■■■■■■■■.

Web2PDF
converted by Web2PDFConvert.com